
# 1.2 දෛනික අවශ්‍යතා හා විද්‍යාත්මක කටයුතු වලදී භෞතික රාශි සහ උචිත ඒකක භාවිතා කරයි.

(අභ්‍යාස)



***අභ්‍යාසය***

1) භෞතික රාශි කිහිපයක ඒකක පහත දක්වා ඇත. ඒවායෙන් නිවරදි ලෙස සංකේත යොදා ඇත්තේ කවරකද?

1. KM 2. Km 3. kM 4. km 5. k m

2) පහත දැක්වෙන්නේ වස්තුවක ඝූර්ණය දැක්වෙන පිළිතුරක් ලියා ඇති ආකාර 5කි. මින් නිවරදි පිළිතුර කුමක්ද?

1. 5Nm 2. 5 Nm 3. 5 N m 4. 5nm 5. 5 NM

3) සම්මත ඒකකයේ උපසර්ග පිළිබද කර ඇති පහත ප්‍රකාශ සලකා බලන්න.

A - උපසර්ග භාවිත කරනුයේ දිග පිළිබද මිනිම් සදහා පමණි.

B - උපසර්ග භවිතා කරනුයේ මූලික භෞතික රාශි සදහා පමණි

C - කෝණ මැනීමේදී උපසර්ග භාවිතා නොවේ.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වනුයේ,

1. A පමණි. 2. B පමණි. 3. C පමණි.

4. A හා Bපමණි. 5. B හා C පමණි.

4) බස් රථයක වේගය පැයට කිලෝ මීටර් 60ක් ලෙස සටහන් විය . මෙම වේගය තත්පරයට මීටර් වලින් ගණනය කර දක්වන්න .

5) බෝතලයක පරිමාව 2L ලෙස සදහන් කර ඇත. එම පරිමාව ඝන මීටර් වලින් දක්වන්න.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : සුමතිපාල විදානපතිරණ මයා. - ගුරු උපදේශක ( වලස්මුල්ල අධ්‍යාපන කලාපය)
පරිගණක පිටු සැකසුම : නදීශා මධුශානි මෙනවිය - ගා/ කටුකුරුන්ද ධාර්මික ම.වි. , හබරාදුව.
අන්තර්ගතය පරීක්ෂා කිරීම : පී. මලවිපතිරණ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - ජාතික අධ්‍යාපන ආයතනය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

6) ඉඩමක වර්ගඵලය 234000 $m^2$ ලෙස සටහන් වේ. මෙය විද්‍යාත්මක අංකනයට අනුව ලියා දක්වන්න.

7) අංශුවක විශ්කම්භය 0.0000043 m ලෙස දක්වා ඇත. දැක්වීමට වඩාත්ම සුදුසු උපසර්ගය වනුයේ,

1. ඩෙසි 2. සෙන්ටි 3. මිලි 4. මයික්‍රෝ 5. නැනෝ

8) ටෙරා යන උපසර්ගයට අයත් ගුණාකාරය වනුයේ,

1. $10^{15}$ 2. $10^{12}$ 3. $10^{9}$ 4. $10^{-9}$ 5. $10^{-12}$

9) පහත සදහන් භෞතික රාශී අතුරින් මූලික භෞතික රාශියක ඒකකයක් වන්නේ කුමක්ද?

1. නිව්ටන් 2. ජූල් 3. ඇම්පියර් 4. හර්ට්ස් 5. වොට්

10) පහත සදහන් රශි අතුරින් ඒකක නොමැති භෞතික රාශිය කුමක්ද?

1. සාපේක්ෂ ප්‍රවේගය 2. සාපේක්ෂ ඝනත්වය

3. සාපේක්ෂ විස්ථාපනය 4. ත්වරණය 5. සංඛ්‍යාතය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

අන්තර්ගතය සකස් කිරීම : සුමතිපාල විදානපතිරණ මයා. - ගුරු උපදේශක ( වලස්මුල්ල අධ්‍යාපන කලාපය)
පරිගණක පිටු සැකසුම : නදීශා මධුශානි මෙනවිය - ගා/ කටුකුරුන්ද ධාර්මික ම.වි. , හබරාදූව.
අන්තර්ගතය පරීක්ෂා කිරීම : පී. මලවිපතිරණ මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - ජාතික අධ්‍යාපන ආයතනය

Copyright © www.e-thaksalawa.moe.gov.lk

පිළිතුරු

| ප්‍රශ්න අංකය | 1 | 2 | 3 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|
| නිවැරදි පිළිතුරු අංකය | 4 | 3 | 3 | 4 | 2 | 3 | 2 |

Copyright © www.e-thaksalawa.moe.gov.lk


Copyright © www.e-thaksalawa.moe.gov.lk